මුදල් අංශය
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09
2010-10-01

දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක : 29/2010

සියලුම මාණ්ඩලික නිළධාරීන්
සියලුම බන්ධනාගාර අධිකාරී,
සහකාර අධිකාරීන් වෙත.

**මහින්ද චින්තනය - 2 යටතේ රාජ්‍ය අංශයේ තොරතුරු තාක්ෂණය භාවිතය සඳහා වන ප්‍රතිපත්ති සහ කාර්යය පරිපාටි ( ඉ- රාජ්‍ය ප්‍රතිපත්තිය) ක්‍රියාත්මක කිරීම.**

රාජ්‍ය අංශයේ තොරතුරු තාක්ෂණය භාවිතය සඳහා වන ප්‍රතිපත්ති සහ කාර්යය පරිපාටිය (ඉ-රාජ්‍ය ප්‍රතිපත්තිය) සම්බන්ධයෙන් අතිගරු ජනාධිපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද 2009/12/16 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය 2009 දෙසැම්බර් 16 වන දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර ඇත. ඒ අනුව ජනාධිපති ලේකම් කාර්යාලයෙන් ඉ-රාජ්‍ය ප්‍රතිපත්ති පිළිගැනීම සහ සියලුම රාජ්‍ය ආයතන වල මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා භාවිතයට ගැනීම සම්බන්ධයෙන් චක්‍රලේඛ නිකුත් කර ඇත. 2010 මැයි 31 වැනි දින නිකුත් කරන ලද SP/SB/03/10 අංක දරණ පිටු 2 කින් යුතු ජනාධිපති ලේකම් ලලිත් වීරතුංග මහතාගේ චක්‍රලේඛය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි. එම චක්‍රලේඛ අංක 14 කින් යුතු කරුණු සාරාංශ කර පහත සඳහන් කරමි.

1. ඉ- රාජ්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා තොරතුරු තාක්ෂණ ඒකකයක් පිහිටුවීම සහ ඊට අදාල කටයුතු.
2. ආයතනයේ දර්ශනය (Vision) සහ මෙහෙවර (Mission) නිරූපනය වන ආකාරයෙන් වාර්ෂික තොරතුරු තාක්ෂණ සැළැස්මක් සකස් කර ක්‍රියාත්මක කිරීම.
3. තොරතුරු තාක්ෂණය සඳහා අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන සහ දැනට පවත්නා උපකරණ, පරිගණක ක්‍රම සහ පරිගණක ජාල (NetWork) සඳහා වාර්ෂික අයවැය ලේඛණයට ඇතුලත් කිරීම.
4. ආයතන අතර සංනිවේදනය සඳහා උපරිම ආකාරයෙන් ඊ-මේල් භාවිතයට යොදා ගැනීම.
5. සිංහල, දෙමළ සහ ඉංග්‍රිසි සහ භාෂා තුනෙන්ම වෙබ් අඩවි පවත්වා ගැනීම.
6. සිංහල සහ දමිළ යුනිකෝඩ් තොරතුරු තාක්ෂණ කටයුතු වලදී භාවිතා කල යුතුවේ.
7. රාජ්‍ය තොරතුරු මධ්‍යස්ථානය - 1919 (GIC - 1919) ට අවශ්‍ය තොරතුරු භාෂා තුනෙන්ම ලබා දීම.
8. ලංකා රාජ්‍ය ජාලය (LGN) හා සම්බන්ධ වී කටයුතු කිරීම.
9. www.life.gov.lk වෙබ් අඩවියෙහි ප්‍රසිද්ධ කර ඇති ලංකා අන්තර් ක්‍රියාකාරී හැකියා රාමුව සහ එහි පරිශිෂ්ඨයන්හි දැක්වෙන ප්‍රමිතීන් වලට අනුකූල විය යුතුය. රජයේ ආයතන වල සහයෝගයෙන් මෙම ප්‍රමිතීන් නියෝජිතායතනය විසින් කලින් කලට සම්මත කරණු ලැබේ.

10, සියලුම රජයේ ආයතන .lk domain එක භාවිතා කල යුතුය. (උදා . www.prisons.gov.lk)

11. සෑම රජයේ ආයතනයකම 1919 කෙටි පණිඩිඩ යැවීම සඳහා භාවිතා කල යුතු වේ.
12. මිලියන 2 ක වැඩි තොරතුරු තාක්ෂණ ව්‍යාපෘති (ICT) රජ්‍ය ආයතන මගින් සිදු කරන්නේ නම් ඒ සඳහා උපදෙස් තොරතුරු හා සංන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයෙන් (ICTA) ලබා ගත යුතුය.

13. රජයේ ආයතන බලපත්‍ර සහිත මෘදුකාංග (Licensed software) භාවිතා කල යුතුය. (උදා Proprietary software / open source software )
14. සියලුම මට්ටමේ නිළධාරීන් තොරතුරු හා සංනිවේදනය පිළිබද පුහුණු කිරීම අවශ්‍ය වේ..

මෙම චක්‍රලේඛණයේ සදහන් පරිදි ඉ-රාජ්‍ය ප්‍රතිපත්තිය සහ කාර්යය පරිපාටිය ක්‍රියාත්මක කිරීම සදහා හැකි උපරිම අයුරින් කටයුතු කරන ලෙස දන්වා සිටිමි. ඉ-රාජ්‍ය ප්‍රතිපත්තිය සහ කාර්යය පරිපාටි ක්‍රියාත්මක කිරීමේ පහසුව සදහා ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය විසින් ප්‍රධාන විධායක නිළධාරියා වශයෙන් මා පත් කර ඇත. (CEO). තවද ප්‍රධාන නවීකරණ නිළධාරී (CIO) වශයෙන් බන්ධනාගාර කොමසාරිස් (මුදල්). ජී.එම්.කේ බණ්ඩාර මහතා පත්කර ඇති අතර වැඩිදුරටත් අවශ්‍ය උපදෙස් ඉදිරියේදී ඔහු විසින් ඔබ වෙත ලබා දෙනු ඇත. තවද ඉ-රාජ්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් හා ගැටලු මා වෙත හෝ ප්‍රධාන නවීකරණ නිළධාරියා වෙත යොමු කරන මෙන් දන්වා සිටිමි.

බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

**වී.ආර්. සිල්වා ආර්එස්පී යූඑස්පී එන්ඩියූ අයිජී**
**මේජර් ජෙනරාල්**
**බන්ධනාගාර කොමසාරිස් ජනරාල්**
**බන්ධනාගාර මූලස්ථානය**
**කොළඹ 09.**

<u>පිටපත්</u>

1. ජනාධිපති ලේකම්.
2. විගණකාධිපති.
3. ලේකම් - පුනරුත්තාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය.
4. අධ්‍යක්ෂ - රාජ්‍ය අංශ ප්‍රතිනිර්මාණය කිරීමේ වැඩසටහන